පාසලේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය සඳහා

# ශ්‍රී ලංකා ගුරු සේවයේ ජාතික පාසල් ගුරුවරුන්ගේ වාර්ෂික/අනිවාර්ය ස්ථාන මාරු සඳහා මාර්ගගතව අයදුම්පත් කැඳවීම - 2024

## උපදෙස් සංග්‍රහය

- 2024 වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ජාතික පාසල් ගුරු ස්ථාන මාරු අයදුම්පත් කැඳවා ඇති අතර **මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පමණක් ස්ථාන මාරු අයදුම් කළ යුතු ය.**
- අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර https://nemis.moe.gov.lk දිගුව මගින් ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතියට(NEMIS) තම ජාතික හැඳුනුම්පත් අංකය මගින් පිවිස එහි දැක්වෙන තොරතුරු නිවැරදි බවට තහවුරු කර ගත යුතු ය.
- තම තොරතුරු ඇතුළත්ව නැත්නම් හෝ යම් සංශෝධනයක් සිදු විය යුතු නම් හෝ තමා සේවය කරන පාසල අයත් **කලාප අධ්‍යාපන කාර්යාලයේ NEMIS සම්බන්ධීකරණ නිලධාරියා හමුවී අදාළ ලේඛන ඉදිරිපත් කර තොරතුරු යාවත්කාලීන කර ගත යුතු ය.**

**අයදුම්පත් මාර්ගගත ව යොමු කළ හැකි කාල සීමාව 2024.04.25 දින සිට 2024.05.16 දින දක්වා වේ.**

1. **අයදුම්පතට පිවිසීම සඳහා** https://nstt.moe.gov.lk දිගුව **භාවිතා කළ යුතු ය** . අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර එහි සඳහන් උපදෙස් කියවා අවබෝධ කර ගත යුතු ය. (මෙම උපදෙස් සංග්‍රහය ඔබගේ විදුහල්පති වෙත ද යොමු කර ඇත.)
2. වෙනත් ආකෘති පත්‍ර මගින් ඉදිරිපත් වන කිසිඳු ඉල්ලීමක් ස්ථාන මාරු ක්‍රියාවලිය සඳහා අදාළ කරගනු නොලැබේ.
3. එම අයදුම්පතේ අංක 01 සිට 26 දක්වා කොටස්වලට අදාළ තොරතුරු උපදෙස් සංග්‍රහය ප්‍රකාර ව සම්පූර්ණ කළ යුතු ය. Submit කළ පසු ව නැවත සංශෝධන කළ නොහැකි බැවින් submit කිරීමට පෙර අයදුම්පතෙහි සඳහන් තොරතුරුවල නිරවද්‍යතාව තමා විසින් ම තහවුරු කර ගත යුතු ය.
4. නිවැරදි අයදුම්පත මාර්ගගත ව submit කිරීමෙන් පසු අයදුම්පත බාගත කර, මුද්‍රණය කර ගත යුතු ය. එම මුද්‍රිත පිටපතෙහි තම අත්සන හා දිනය යොදා විදුහල්පති වෙත 2024.05.17 දින හෝ එදිනට පෙර හෝ භාර දිය යුතු වේ.
5. අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් ලිපි ලේඛන විදුහල්පති වෙත භාර දීමට ගුරුවරුන් වග බලා ගත යුතු ය.
   i. මුල් පත්වීම් ලිපියේ විදුහල්පති සහතික කළ පිටපත
   ii. අවසන් වරට ඔබ වෙත නිකුත් කර ඇති ස්ථාන මාරු ලිපියේ විදුහල්පති සහතික කළ පිටපත
   iii. 2024 වර්ෂයේ පෞද්ගලික කාලසටහනේ විදුහල්පති සහතික කළ පිටපත
   iv. පත්වීම් විෂයය නොවන විෂයක් උගන්වන්නේ නම්, ඒ සඳහා වන ඉහළම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතිකවල විදුහල්පති සහතික කළ පිටපත
   v. වෛද්‍ය කරුණු ඉදිරිපත් කිරීමට ඇත්නම් TTB/2024/05 ආකෘතිය
6. වෛද්‍ය කරුණු ඉදිරිපත් කිරීමට අවශ්‍ය නම්, වෛද්‍ය සහතිකය TTB/2024/05 ආකෘතිය මගින් රජයේ රෝහලක හෝ ලියාපදිංචි පෞද්ගලික රෝහලක හෝ රෝගියාට ප්‍රතිකාර කරනු ලබන විශේෂඥ වෛද්‍යවරයා විසින් ඉදිරිපත් කළ යුතු වේ. (ඖෂධ වට්ටෝරු හෝ සායනික සටහන් හෝ විවිධ වෛද්‍ය පරීක්ෂණ වාර්තා වෛද්‍ය සහතික ලෙස භාර නොගන්නා බව අයදුම්කරුවන් විසින් සැලකිය යුතු ය.)
7. ගුරු ස්ථාන මාරු අවසාන ලැයිස්තුව ප්‍රසිද්ධ කිරීමෙන් පසු පළාත් රාජ්‍ය සේවය සඳහා නිදහස් වීමට නිර්දේශ ලබන ගුරුවරුන් විසින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ලේඛන පිළිබඳ දැනුවත් කරනු ලැබේ.
8. **ඉහත 5 යටතේ යොමු කරන ලියවිලි හැර වෙනත් බාහිර පාර්ශවයන්ගේ නිර්දේශ සහිත ලිපි, පාසල්වල පුරප්පාඩු ලිපි අයදුම්පත්‍රයට ඇමිණීමෙන් වැළකී සිටිය යුතු ය.**
9. **අයදුම්පත්‍රය අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ශාඛාව වෙත යොමු කිරීමෙන් පසු අතිරේක ලිපි ලේඛන කිසිවක් භාර ගනු නොලැබේ.**
   - ජාතික පාසල් ගුරු ස්ථාන මාරු අයදුම්පත් නිවැරදිව සම්පූර්ණ කිරීම හා මුද්‍රිත පිටපත 2024.05.17 දින හෝ එදිනට පෙර හෝ තම අත්සන හා දිනය නිවැරදිව සටහන් කරමින් නියමිත ඇමුණුම් ද සහිත ව විදුහල්පති වෙත භාර දීම ගුරුවරුන්ගේ වගකීම වේ.
   - එසේ භාර දෙන අයදුම්පත් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ විදුහල්පති වෙත උපදෙස් මාලාවක් නිකුත් කර ඇත. විදුහල්පති නිර්දේශය මාර්ගගත ව ලබා දීමටත්, විදුහල්පතිගේ නිර්දේශ සහිත කොටසේ මුද්‍රිත පිටපතෙහි විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව ද දිනය ද පැහැදිලි ව යොදා නියමිත ලේඛන ද සමග 2024.05.28 දින හෝ එදිනට පෙර හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ගුරු ස්ථාන මාරු ශාඛාව වෙත පැමිණ භාර දීම විදුහල්පතිගේ වගකීම වේ. මෙහි දී මෙම අයදුම්පත් එක් ගොනුවක් ලෙස විදුහල්පති විසින් හෝ බලය පවරන නියෝජ්‍ය / සහකාර විදුහල්පති විසින් හෝ ගෙනැවිත් භාර දිය යුතු ය.
   - මෙම ක්‍රමවේදයන්ට බැහැරව ලැබෙන කිසිදු අයදුම්පතක් 2024 වාර්ෂික/අනිවාර්ය මාරු මණ්ඩලය වෙත යොමු නොකෙරේ. තැපැල් මාර්ගිකව ලැබෙන අයදුම්පත් කරුණු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
   - මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම් කිරීම, මුද්‍රණය කර ගැනීම, විදුහල්පති විසින් මාර්ගගත ව නිර්දේශ ලබා දීම යන කරුණුවලට අදාළ වන **තාක්ෂණික ගැටලු සම්බන්ධයෙන් 011- 2075854 (දත්ත කළමනාකරණ ශාඛාව) දුරකථන අංකය හරහා රාජකාරි කාලය තුළ දී විමසිය හැකි ය.**
   - ගුරු ස්ථාන මාරු වීම පිළිබඳව වූ ගැටලු සම්බන්ධයෙන් 011-2784434 (ගුරු ස්ථාන මාරු ශාඛාව) දුරකථන අංකය හරහා රාජකාරි කාලය තුළ දී විමසිය හැකි ය.

ජේ. එම්. තිලකා ජයසුන්දර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය